

(සුවඳ)
සොරුන් වෙත
ආධ්‍යාත්මික විමර්ශකයන් උදෙසා...
NIRVANA DHAMMA
නිර්වාණ ධර්ම
www.nirvanadhamma.com

# (සුවඳ) සොරුන් වෙත

## www.nirvanadhamma.com

["නිර්වාණ ධර්ම" වෙබ් අඩවියේ ප්‍රකාශිත ලිපි ඇසුරිනි]


(සුවඳ) සොරුන් වෙත

-----------------------------------------------------------

රජිතා විදුරන්සි

-----------------------------------------------------------

ප්‍රථම මුද්‍රණය     ශ්‍රී බු.ව.2565 (ක්‍රි.ව.2022)

-----------------------------------------------------------



බුදු පියාණන් වහන්සේ ගේ සත්ධර්මයට අයිතිවාසිකම් දැමීමට අප කිසිවකුටත් නොහැකිය. ලාභය කීර්තිය ප්‍රශංසාව පිණිස යොදා ගෙන තම තමන්ට අයහපතක් සිදු කර නො ගෙන සැමගේ යහපත පිණිස ම ලබා දෙන්නට කටයුතු කරත්වා!!!



-----------------------------------------------------------

පරිගණක අකුරු සැකසුම සහ පිටකවර නිර්මාණය
රජිතා විදුරන්සි - කැළණිය, ශ්‍රී ලංකා

-----------------------------------------------------------

ප්‍රකාශනය - ග්‍රන්ථයක් වශයෙන් මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කර නොමැත

# පිදුම

======

**උත්තරීතර ශ්‍රී සද්ධර්මයේ පිපාසයෙන්**
**පෙළෙන්නාවූ සෑම සියලූ සතහට ත්...**
**නිර්වාණ අවබෝධය පිණිස**
**අංගු මාත්‍ර වශයෙන් හෝ**
**උපකාර කරගත හැකි**
**අමා පැන් පොදක්ම වේවා!!!**

======

-----------------------------------------------------------

"බාහිරයේ දෑ සොයන්නට... අනුන්ගේ දෑ සොයන්නට... යොමු කරන සිත
තමන්වම සොයාගැනීමට යොමු කරන්නේ ප්‍රඥාවන්තයාය!
තමන්ට හමුවන සෑම දෙයක්ම තමන්ගේ යථාර්ථය සොයාගැනීම පිණිස
භාවිතා කරන්නේ ප්‍රඥාවන්තයාය!
එවන් ප්‍රඥාවන්තයින්ට බාහිරවූ දෑහි...
බාහිරවූ පුද්ගලයන්ගේ අඩුපාඩු දැකීම පිණිස
වැය කරන්නට කාලයක් නැත්තේමය!
තමන්ටම යොමුවූ සිතැතිව වාසය කරයි!
තමන්වම සොයාගනියි!
**තමන්ගෙන් නිදහස්ව තිවීම අත්දකියි!!!**"

-----------------------------------------------------------

බුදු වදනක්...

තථාගතප්පවේදිතො ධම්මවිනයො භික්ඛවෙ
විවටො විරෝචති නො පටිච්ඡන්නො

≈

තථාගතයන් වහන්සේ විසින්
දේශනා කරන ලද ධර්මය, විවෘත වූයේ ම බබලයි
වැසුනේ නොම බබලයි!

## කතෘගෙන් සටහනක්...

සත්ධර්ම දැනුම සහ අවබෝධය යනු අවස්ථා දෙකකි. සත්ධර්ම දැනුමකින් තොරව සත්ධර්මාවබෝධයට පත්විය හැකි අතර වර්ථමානය වන විට සත්ධර්ම දැනුම නිසාම සත්ධර්මාවබෝධයට පත්වන මානසිකත්වය බොහෝ පිරිසකගෙන් ගිලිහී ඇති සෙයකි. මෙවැනි සත්ධර්ම කරුණු රැගත්තා වූ ග්‍රන්ථයන් තුල පවසන දෑ වැටහීම යනු සත්ධර්ම **දැනුම ලැබීමක් විනා** සත්ධර්මාවබෝධයට පත්වූවා යැයි නිගමන නොගත යුතුයි.

කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය තුලින් සත්ධර්මයක් ශ්‍රවණය කරන්නාවූ අවස්ථාවක තම තමන්ගේ සිත් තුල යෝනිසෝමනසිකාරය සහ ධම්මානුධම්මපටිපදාව යන කරුණු දෙක යෙදෙන අවස්ථාවක සත්ධර්මාවබෝධය සිද්ධ වේ. සත්ධර්මාවබෝධයක් ලත් කෙනෙකුට මෙසේ කියවා ගන්නා දැනුමද තම තමන්ගේ මාර්ගය අප්‍රමාදීව ඉක්මනින් පූර්ණය පිණිස භාවිතා කරගත හැකිය.

තවමත් ධර්මාවබෝධයකට පත් නොවූ පුද්ගලයෙකු හට පොත පත කියවීම යනු ධර්මයට කැමැත්තක් ඇති කරවා නිවන් මාර්ගය පිණිස උනන්දුවක් ඇති කර දෙන උපකාරකයක් පමණි. පෙර නොඇසූ විරූ දහමක් ප්‍රථම වරට කියවා තේරුම් ගන්නවා යැයි යමෙක් කියන්නේ නම්... ඒ තුලින් මාර්ග ඵලයක් ලබන්නේ යැයි යමෙක් කියනවා නම්... එය කුඩා දරුවෙකු විසින් අකුරු ලියන්නේ කියවන්නේ කෙසේද යන්නවත් නොදැන විශ්වවිද්‍යාලයක විභාගයක් සමත් වීමට හැකි යැයි පවසනවා වැනි දෙයකි.

රාගයක් ද්වේශයක් මෝහයක් වැඩෙන්නාවූ දෙයක්ම කියවා ඇසුරු කරනවාට වඩා රාගයෙන් ද්වේශයෙන් මෝහයෙන් මිදීමේ යහපත පෙන්වා දෙන්නාවූ අර්ථවත් සත්ධර්මය රැගත් පොත පත කියවීම වඩාත් යහපත් දෙයකි. එහෙත් සෑම විටකම මේ ධර්ම දැනුම යනු ධර්මාවබෝධයට පත්වීම නොවේ යන සිහියෙන් යුක්තව සිටීම... අධික මාන්නයන් ආදිය ඇතිවීමෙන් වැළකී නිසි ලෙසින් ධර්මාවබෝධයට පත්වීමට අවශ්‍ය කරන්නාවූ පසුතලය දීමට හැකියාවක් ලැබේ.

ධර්ම දැනුමෙන් පොහොසත් වූවාට ඒ දැනුමෙන් පවසන්නාවූ දෑ කෙරෙහි අවබෝධයෙන් තොර නම් ඒ දැනුමෙන් ලැබෙන යහපත් ඵලයක් නොමැත. මේ පොත පතෙහි සඳහන් වන්නාවූ දහම් දැනුම අංශු මාත්‍ර තරමින් හෝ වැටහෙන ආකාරයෙන් තම තමන්ගේ ජීවිත වලට ලංකරගෙන නිසි ඵල නෙලාගැනීමට ප්‍රඥාවන්තවන්ත වන්න! ඔබව බේරාගැනීමට කිසිවෙකුත් නොමැති අතර ඔබේ ගැලවුම්කාරයා විය යුත්තේ ඔබම පමණි!!! කළ්‍යාණ මිත්‍රත්තවය තුලින් ඒ සඳහා ඔබට අවශ්‍ය කරන මඟ පෙන්වීම ලබා ගත හැකියි!!!

රජිතා විදුරන්සි - කැළණිය | ශ්‍රී ලංකාව
viduransi@gmail.com | www.nirvanadhamma.com

**කෘතඥතෝපහාර...**

කුඩා අවධියේ පටන් ගෙනම මාගේ චිත්ත සන්තානයේ
සමීපතම කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේ වශයෙන් කටයුතු කලාවූ
මඟ නොමඟ පෙන්වා දුන්නාවූ
ඒ අප භාග්‍යවත් වූ ලොව්තුරා සම්මා සම්බුදුරජාණන්වහන්සේට...
ඒ අමා මෑණියන්වහන්සේට... ඒ බුදු පියාණන්වහන්සේට
**මාගේ පළමු නමස්කාරය වේවා!!!**

නිසි මඟ නිසි ඵල නෙලා ගන්නට උපකාරයක්ම වන්නාවූ
නිවීම පිණිසම රැකවරණය ලබා දෙන්නාවූ ඒ උත්තරීතර සත්ධර්ම රත්නයට
**මාගේ දෙවන නමස්කාරය වේවා!!!**

උතුම්වූ මහ රහතන්වහන්සේලා ප්‍රමුඛ කරගත්තා වූ
ආර්ය මහා සංඝරත්නයටත්...
නිවන් මාර්ගය කළ එළි කර ගැනීම පිණිස
අප්‍රමාදීව නිවන් මාර්ගය පූර්ණය කර ගැනීම පිණිස
නන් අයුරින් අවවාද අනුශාසනා ලබා දුන්නා වූ සෑම සියලූ
කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේලා හට
**මාගේ තෙවන නමස්කාරය වේවා!!!**

අනන්ත සසර පුරාවට දෙමව්පියන් ලෙසින් කටයුතු කලා වූ
ගුරු භවතුන් ලෙසින් කටයුතු කලා වූ
සහකරුවන් සහකාරියන් ලෙසින් කටයුතු කලා වූ
ඥාති හිතමිත්‍රාදීන් වශයෙන් කටයුතු කලා වූ
පෙනෙන නොපෙනෙන සෑම සියලූ සත හට
**මාගේ හතරවන නමස්කාරය වේවා!!!**

අංශු මාත්‍ර වශයෙන් හෝ ඒ උත්තරීතර නිවීම පිණිසම හේතුවන්නාවූ සත්ධර්මය
විවෘත කරමින් බබළවන්නාවූ මොහොතක් පාසා ලැබෙන්නාවූ
ඒ සියලූ යහපත්වූ පුණ්‍ය කුසල ශක්තීන්
**සියලූ ලෝ සතට නොඅඩුව ලැබේවා!!!**

ඒ අප්‍රමාණ පුණ්‍ය කුසල ශක්තීන්ගේ බලයෙන් අනන්ත සසර පුරාවට
කරන්නට යෙදුනාවූ **සියලූ පුණ්‍ය කුසල ශක්තීන් ඇදී ඒවා!!!**

ඒ අප්‍රමාණ පුණ්‍ය කුසල ශක්තීන්ගේ බලයෙන්
සියලූ දුක් කෙලවර කරගැනීම පිණිස
සියලූ සතට ධර්මාවබෝධයටම හේතු සකස් වේවා!!!
**තෙරුවන් සරණ ලැබ සෑම සතට නිවී සැනසීමම වෙත්වා!!!**

~~~~~~~~~~~~~
~~~~~~~~~~~~~

# (සුවඳට හොරුන් වෙත ලියමි...

ගිහි වේවා පැවිදි වේවා නිවන් මඟ ගමන් කරන්නට අවංකව ම කැප වී සිටින්නෙකුට තමන්ගේ කැපවීම කොතරම් මට්ටමකින් සිදු විය යුතු දැයි අවබෝධ කර ගැනීම ඉතාමත් වැදගත්. තමන් ඇත්තට ම නිවෙන්නට කැමතියි නම්... දුලභව ලද බුදු සසුන මඟ හරවා ගන්නට අකමැතියි නම්... උතුම් සම්මා සම්බුදු රඳුන් විසින් නිරන්තරයෙන් ලබා දුන් අවවාද අනුශාසනා විමසිය යුතුයි. අන්න ඒ විමසීම තුල ඉන්න අප හට, කල්‍යාණ මිත්‍ර ඔබගේ විමසුමට පහසුවක්, රුකුලක් වීම පිණිස අපට ලැබෙන දේ අපට හැකි පමණින් බෙදා ගැනීමට තමයි "නිර්වාණ ධර්ම සදහම් සත්කාරය" සකස් කරලා තිබෙන්නේ. ඒ පණිවිඩය ඔබට මඟ හැරෙන්නට ඇති අවස්ථා හඳුනා ගෙන, ඒ පණිවිඩය නිවැරදිව හසු කර ගැනීමටත් උපකාර වන දහම් කොටසක් සමඟින් ම අපගේ අප්‍රමාදය සකස් විය යුතු අන්දම විමසන්නට මේ දහම් විග්‍රහය තුලින් උත්සාහ කරමු. **භිසපුප්ඵ ජාතකය සහ සංයුක්ත නිකායේ පදුමපුප්ඵ සූත්‍ර දේශනාව ඇසුරෙනි**

## නෙළුම් විල

මුලින් ම ත්‍රිපිටක සත්ධර්මය තුල ඇති දහම් කොටසකට සම්බන්ධ අටුවා කතාවකින් අපේ විග්‍රහය ආරම්භ කරමු. ඉතාමත් කෙටියෙන් ඒ කතාව පවසනවා නම් මෙසේයි;

මේ සිද්ධිය සිදු වන්නේ අප මහ බෝසතාණන් වහන්සේ සෘෂිවරයෙක් ලෙසින් තපස් ජීවිතයක් ගත කරන අවස්ථාවකයි.

**මේ තාපස තුමා හිටියේ නෙළුම් විලක් ලඟ. ඉතින් එක දවසක් විලට බැස්ස වෙලාවක, ඒ විලේ තමන් අසල ම පිපී තිබූ නෙළුම් මලක සුවඳ පොඩ්ඩක් බැලුවා.**

මේක දැකලා එක්තරා දේවතාවියක් මෙන්න මෙහෙම කිව්ව;

**"තාපස තුමනි, විලේ පිපී තිබෙන, ඔබට නො දුන් ඒ නෙළුම් මලේ සුවඳ ආඝ්‍රාණය කලා නේද? එය හොරකමට අයත් අංගයකි. ඔබ සුවඳ හොරෙකි"**

ඉතින් තාපස තුමා මෙන්න මෙහෙම ඇහුවා;

**"නෙළුම සොරකම් කලෙත් නෑ... කැඩුවෙත් නෑ... දුර තියා සුවඳ බැලුවා විතරයි නේ. ඉතින් "සුවඳ හොරා" කියන්නේ මොන හේතුවකට ද?"**

මේ දෙදෙනාගේ මේ සංවාදය යන අතරේ එක්තරා මනුස්සයෙක් ඒ විලට ඇවිත් නෙළුම් මල් කඩන්න පටන් ගත්තා... නෙළුම් අලත් හාරන්න පටන් ගත්තා...

ඔන්න ඉතින් තාපස තුමා ඒ මනුස්සයා පෙන්නලා දේවතාවියට මෙන්න මෙහෙම කිව්ව;

"නෙළුම් මල කඩන්නෙ වත් නැතිව සුවඳ පොඩ්ඩක් බැලුව මට "සුවඳ හොරා... සුවඳ හොරා... කියලා දොස් කියන ඔබ, අන්න අර මනුස්සයා නෙළුම් මල් කඩා ගෙන... අලත් හාර ගෙන යන විට මොනවත් කියන්නේ නෑ... ඒ මනුස්සයාටත් දොස් කියන්න පුළුවන් නේ... මට විතරක් දොස් කියන්නේ ඇයි?"

එවිට දේවතාවිය මෙන්න මෙහෙම කියනවා;

"දරුවන් බලා ගන්න කිරි මවක ගේ ඇඳුම් නිතරම ඒ දරුවාගේ කෙල, සොටු, මුත්‍රා, අසූචි ආදිය තැවරිලා කිලිටි වෙලාමයි තියෙන්නේ. අන්න ඒ වගේ කිලිටි වෙලා ම ඇති සිත් ඇති රළු අදහස් ඇති නපුරු මිනිස්සුන්ට කියන්න වචන මගේ ලඟ නෑ. නමුත් ඔබ වැනි තපස් දම් අගයන කෙනෙකුට මේ දේ කියා දීම සුදුසු නිසයි කිව්වේ. නිතර නිවැරදි දේ ම සොයන, නිර්දෝෂ වූ පුද්ගලයකුට, කෙස් අගක් පමණ වූ පාපයක් වුවත්, මහා මේඝයක් වගේ තමයි දැනෙන්නේ. අන්න ඒ නිසා තමයි කිව්වේ, කියලා කිව්ව"

ඉතින් මේ වදන් ඇසූ තාපස තුමා, තමන්ට වූ ලාභය ගැන සතුටු වෙලා මෙන්න මෙහෙම කියනවා;

"දේවතාවිය, ඒකාන්තයෙන් ම ඔබ මාව නිවැරදිව හඳුනා ගත්තා. ඒකාන්තයෙන් ම ඔබ මාව නිවැරදිව හඳුනා ගත්තා... මේ වගේ වරදක් දුටු තැන මට පෙන්වා දෙන්න!"

එසේ පැවසූ තාපස තුමාට, දේවතාවිය මෙසේ පවසනවා;

"තාපස තුමනි, මම ඔබ නිසා ජීවත් වන කෙනෙක් නොවේ. ඔබේ බැල මෙහෙවර කරන කෙනෙක් ද නෙවේ. යමක් නිසා සුගතියට යන්නේ නම් ඔබ ම එය තේරුම් ගන්න"

## පසු කතාව

ඉතින් මේ කතාව සම්මා සම්බුදු රඳුන් විසින් එක්තරා භික්ෂූන් වහන්සේ කෙනෙකුට තමයි පවසන්නේ. මේ කතාව පවසන්නට හේතු වූ කාරණය මෙයයි.

ඒ නෙළුම් විලේ සුවඳ හොරකමට හසු වූ සිද්ධියක් ඒ නිවන් මඟ වඩන භික්ෂුවටත් සිද්ධ වෙනවා. ඒ හිමි නමත් විලක පිපී තිබූ නෙළුම් මලක සුවඳ ආඝ්‍රාණය කරන විට ඒ ක්‍රියාව දුටු දේවතාවෙක් ඒ හිමි නමට "ස්වාමීනි ඔබ සුවඳ සොරෙකි. ඔබ කල ක්‍රියාව සොරකමට අයත් අංගයකි" යැයි පවසනවා. ඒ සිද්ධියෙන් සංවේගය පත් වූ ඒ හිමි නම වහාම සම්මා සම්බුදු රඳුන් සොයා ගෙන යනවා. ඒ ගැන බුදු රඳුන්ට පවසා එහි ගැඹුර විමසන්නට තමයි ඒ හිමි නමට අවශ්‍ය වුණේ.

සිද්ධිය පැවසූ පසු, බුදු රඳුන් ඒ හිමියන්ට මෙන්න මෙහෙම කියනවා;

"ඔබට පමණක් නොවේ මහ පඬිවරුන්ට පවා ඔවැනි අත්දැකීම් ලැබෙනවා"

ඒ විදියට තමයි අපේ සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් තමන් වහන්සේගේ බෝසත් අවදියේ දී සිදු වූ ඒ පෙර කතාව ඒ හිමියන්ට පවසන්නේ.

**මෙහෙම මහ බෝසතුන් වහන්සේට ඒ ජීවිතයේ දී අවවාද දුන්න ඒ දේවතාවිය කව්ද දන්නවද?**

**ගෞතම බුද්ධ ශාසනයේ ඍද්ධිමත් භික්ෂුŒන් අතරෙහි අග්‍රස්ථානය ලැබූ අග්‍ර ශ්‍රාවිකා වහන්සේ වූ උත්පලවණ්ණා මහ රහත් තෙරණිය යි.**

ඉතින් මේ සුවඳ හොරකමේ ගැඹුර අවබෝධ කරන ඒ හිමි නම දේශනාව අවසානයේ සෝතාපන්න ඵලයට පත් වෙනවා කියලා තමයි ධර්මයේ තිබෙන්නේ.

ටිකක් හිතන්න, ඔව්... නුවණින් විමසන්න... මේ කතාවෙන් කියැවෙන්නේ **නොකැඩූ මලක දුර තබා සුවඳ ආඝ්‍රාණය කිරීම සොරකමක් වන්නේ කෙසේ ද** යන්න ගැනයි. **එය නුදුන් දෙයකින් යැපීමක් වෙන්නේ කොහොමද කියන දේ** ගැනයි. තවත් ආකාරයකින් කියනවා නම් **ලෝකෝත්තර කුසලය සහ අකුසලය ගැන අවබෝධ කර ගන්නට හැකි දහම් කොටසක්. පෙර නො ඇසූ විරූ දහම් අවබෝධ කල හැකි දහම් කොටසක්.**

ප්‍රඥාවන්තයා ට තමන් සංවේගයට පත් වන කාරණාවක් වේ නම් එය ම නිවන් මග විවර කර ගන්නට උපකාරයක්. හරියට මේ හිමි නම, තමන්ට **"සුවඳ හොරා"** ලෙසින් පැවසූ විට එහි ගැඹුර විමසන්නට තීරණය කලා වගේ.

# අප්‍රමාදී බවට වදනක්

"නිර්වාණ ධර්ම" සමඟ රැඳී සිටින කලණ මිතුරු ඔබට, අප විසින් නිරන්තරයෙන් යම් යම් දේ පවසනවා.

ඒ අතර පැවැත්ම තුල, ලෝකය අගය කරන... ලෝකයේ ඇලෙන ගැටෙන බැඳෙන වැඩපිළිවෙළ අගය කරන බහුතරයක් පිරිස කියන, කරන, සිතන ආකාරයට නො සිතා, ඒ කාරණා කෙරෙහි ධර්මය මුල් කර ධර්මයට අනුව ගලපා දකිමින් කටයුතු කර ගන්නේ කොහොමද කියලා අපට වැටහුණු පමණින් පෙන්වා දෙනවා.

**සිතට එකඟ ව කටයුතු කරන්නේ නැතිව ධර්මයට එකඟ ව කටයුතු කල යුතු බවත්, සුළු මාත්‍ර වරද පවා දකිමින් කටයුතු කල යුතු බවත් සම්බුදු ඔවදනට අනුව බෙදා ගන්නවා.**

**ඇයි ඒ? කාට ද මේ කියන්නේ?**

මොහොතකට හෝ නිවෙන්නට කැමතියි... දුකෙන් මිදෙන්නට කැමතියි... ධර්මයේ හැසිරෙන්නට කැමතියි... මේ අනාථ සසරෙන් මිදෙන්නට ඕනෑ යැයි... ඔබ ම අප සමඟ පවසා ඇති නිසාම තමයි මේ කියන්නේ. ඒ කියමන කිව්වේ අවංකව ම නම්, නිවන් මගට බාධා වන තමන්ට එකවර හසු කර ගන්නට නො හැකි, අංශු මාත්‍ර හෝ අඩුපාඩුවක් යමෙක් සිහිපත් කර දෙන විට, එය තමන්ට ලැබූ ලාභයක් ම බව හඳවතට දැනේවි. අපට නම් එය එසේ මැයි!

පැවැත්ම කියන්නේ අවුල් ජාලාවක්... ගිනි ජාලාවක්... එහි අවමයෙන් හෝ නො දැවී ඉන්නවා කියන්නේ, එය පුදුමාකාර දක්ෂ කමක්.

පැවැත්ම තුල යම් ප්‍රශ්න යැයි කියා ගන්නා දේවල් ප්‍රකට වෙලා තියෙන කාලෙක දී, ධර්මය අහන්න කැමතියි කියන ඔබට ම, ධර්මය මහා හිසරදයක් වෙනවා නම්... "මේ

වෙලාවේ බණ කියන්න එන්න එපා" කියලා කියන්නට හිතෙනවා නම්... ඉගියකින් හෝ හඟවනවා නම්... ඔබ ගේ බණ ඇසීමත් ඉතින්, "කරන්නට වැදගත් වැඩක් නැති වෙලාවට, ලෝකයාට පෙනෙන්නට, තමන්ගේ සිත සතුටු කර ගන්නට, කාලය ගෙවා දමා ගන්නට", අහන බණ වගේ නේද?

ඉතින්, ලෝකයක් ම ඉහලින් අගය කරමින්, දැවෙන විට... පොර කන විට... ලෝකය තුලින් ම විසඳුම් සොයමින් ඒ විසඳුම් අගය කරමින් කටයුතු කරන විට... එසේ නොවී, ඒ රැල්ලට ගසා ගෙන යන්නේ නැතිව තමන්ට අවශ්‍ය යැයි පැවසූ විමුක්තිය පිණිස කටයුතු කර ගන්නට කැප වෙන්නට යැයි අප සිහිපත් කරන විට...

**"ඇයි අපිට ම කියන්නේ? ලෝක සම්මත වැරදි කරුවන්ගේ වැරදි පේන්නේ නැද්ද... ලෝක සම්මත නිවැරදි කරුවන්ට අනුකම්පා කරන්නේ නැද්ද...? මේ වෙලාවේ ඒ අය වෙනුවෙන් පෙනී සිටිය යුතු නොවේ ද?"** යැයි අපෙන් විමසුවාට එලක් නෑ.

අපට කියන්නට තියෙන්නෙත් "නපුරු වූ සිත් ඇති කිරි මවකගේ වස්ත්‍රයක් සේ කිලිටි සිත් දරා ගෙන ධර්මයට එකඟ ව කටයුතු කරන්නට තවමත් සූදානම් නැති බහුතරයකට පවසන්නට වදන් අප ලඟ නැත" කියලා තමයි.

"නිර්වාණ ධර්ම" වදන් සියල්ල ම අතිශයින් ම ලෝකෝත්තර මඟ විවර කර ගන්නට කැමති, නිවෙන්නට කැමැත්තෝ උදෙසා ම පමණයි!

## ඔබ කොයි පාර්ශවයේ ද?

ඔබ වටහා ගත යුතු ප්‍රධාන කාරණය නම් මෙතැන **පාර්ශව දෙකක් ඉන්නවා.**

- **එක් පාර්ශවයක් මල් කඩා ගෙන, අලත් හාර ගෙන බාහිරයෙන් ම යැපෙන පැවැත්ම තුල සාධාරණය අසාධාරණය දකිමින් කටයුතු කර ගෙන යන ලෞකික වැඩපිළිවෙළට බැස ගත් පිරිස. ඒ සිත් කිරි මවගේ කිලිටි වස්ත්‍රය වගේ.**

ඒ අය මල් අල කොල නටු වෙනුවෙන් ඕනෑම දෙයක් කියන්නට, කරන්නට, සිතන්නට සූදානම්. මන්ද ඒ අය ඒ දේවල් වලින් ම යැපෙන... ඒ දේවල් තුල ලාභයක් දකින පිරිසක්. ඒ නිසා ඒ මල්, අල වෙනුවෙන් ඒ අය සටන් කල යුතුයි. මහා පොරයට බැස ගත යුතුයි.

- **අනෙක් පාර්ශවය තමයි, ඒ කිලිටි බව නැති කර ගන්නට වුවමනාවක් ඇති පිරිස. ඒ කිලිටි වස්ත්‍රය ගලවා දමන්නට කැප වන පිරිස.**

මල්, අල වෙනුවෙන් පොර කෑම එලක් නෑ කියලා යම් දුරකට වටහා ගත්ත පිරිස. ඒ නෙළුම් විලෙන්... ඒ ලෝකයෙන් එතෙර වෙන ලෝකෝත්තර වැඩපිළිවෙලට බැස ගත් පිරිස.

### අමතක කරන්න එපා පාර්ශව දෙකම ඉන්නේ එකම නෙළුම් විලේ.

මේ පාර්ශව දෙකටම බණ දහම් වර්ග තිබෙනවා. ලෞකික වැඩපිළිවෙල තුල සාධාරණ අසාධරණකම් දකිමින් යහපත් සමාජයක් උදා කර ගන්න ලෞකික

සුගතිගාමී වැඩපිළිවෙළක් සහිත බණ දහම් තිබෙනවා. ඒ අර නෙළුම් මල් කඩා ගෙන, අලත් භාර ගෙන යන පිරිසටයි. අනෙක් අයටත් තියලා නෙළුම් මල් කඩා ගන්න විදිය... භාර ගත්ත අල අනෙක් අයත් එක්ක බෙදා ගෙන සාධාරණව ජීවත් වන විදිය... ඒ බණ දහම් වලට අයිතියි.

**නමුත් අති දුලභව පහල වන සම්මා සම්බුදු රජාණන් වහන්සේ කෙනෙක් සාධාරණව අල භාර ගන්න විදියයි... මල් කඩන විදියයි නෙවේ කියන්නේ. උන්වහන්සේගේ අවවාදය සහ උන්වහන්සේ අග්‍ර කරමින් අගය කලේ ලෝකයෙන් එතෙර වීම පිණිස වූ දහමයි. කඩා ගත්තෙවත් නැති මලක සුවඳ පවා ආඝ්‍රාණය කිරීම හොරකමක් වෙන්නේ කොහොමද... එය ඒ නෙළුම් විලෙන් එතෙර වීමට බාධාවක් වෙන්නේ කොහොමද කියන දේ ගැනයි සම්මා සම්බුදු රඳුන් කෙනෙක් සැම විටම මුල් තැන දී විග්‍රහ කර දෙන්නේ.** නිවන පිණිස ම වූ “නිර්වාණ ධර්මය” කියන්නේ එයට යි.

## ඔබගේ වුවමනාව?

ඉතින්, දැන් ඔබ බලන්න ඔබගේ වුවමනාව මොකක්ද කියලා... සාධාරණව අල භාර ගෙන මලක් කඩා ගෙන ඉන්න නම් කැමැත්ත... ඔබගේ අරගලය ඒ මට්ටමෙන් නම් ගැටලුවක් නෑ. **ඔබ එය කර ගෙන යන්න. නමුත් ඔබ ඔබට අවංක වීම වැදගත්!**

**නිවන් දකින්නට ඕනෑ... දුක් කෙළවර කරන්නට ඕනෑ... චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගන්න ඕනෑ... ආර්ය මාර්ගය පිළිපදින්න ඕනෑ කියමින් පැවැත්ම තුල සාධාරණ අසාධාරණකම් සොයමින් තවමත් පැවැත්මත් එක්ක ඔට්ටු වෙනවා නම් ඒ වැඩපිළිවෙළ ම අගය කරන්නට සිතෙනවා නම්, ඔබ කියන දේ සහ ඔබ කරන දේ අතර නොගැළපීමක් තිබෙනවා නේදැයි නුවණින් දැක ගන්න!**

නෙළුම් විලෙන් එතෙර වෙන්නට අවශ්‍යයි ලු... නමුත් තවමත් මල්, අල එක්ක නම් ගනු දෙනුව අවශ්‍යතාවය ඉටු වෙයි ද? කෙටියෙන් කියනවා නම් බුදු රඳුන් පෙන්වා දෙන්නේ මල් අල පැත්තක තියන්න දුර තියා හෝ නෙළුම් විලට සම්බන්ධ මල් සමඟ ඒවා හොඳයි, සුවයි, සැපයි, යහපත් යැයි සුවඳ, පෙනුම, ස්පර්ශය ආදිය වින්දනය කරමින් භුක්ති විඳීම ම නැවත නෙළුම් විලට සම්බන්ධ වන්නට හේතු සකස් කරන බවයි.

ජීවිතය තමන්ගේ... තමන්ට අවශ්‍යයි යැයි කියන විමුක්තිය... සැනසීම... සතුට... එය ලබා ගත යුත්තේ තමන්මයි. තමන්ගේ ගැලවුම් කරුවා තමන්මයි!

**සම්මා සම්බුදු පියවරුන් අනන්ත ගණනින් පහල වෙලාත් අපව ගලවා ගන්නට බැරි වුනේ අපට ගැලවෙන්නට අවශ්‍ය නොවූ නිසාමයි!**

එසේ නම් ඔබ “නිර්වාණ ධර්ම විග්‍රහයන්” ඇසුරු කරනවා නම්, ඔබගේ වුවමනාව නිවැරදිව හඳුනා ගෙන ඇසුරු කිරීම තුලින් ඔබට අප ලබා දෙන්නට උත්සාහ කරන පණිවිඩය නිවැරදිව හසු කර ගන්නට හැකි වේවි! නැත්නම් තර්ක වාද පොදියක් විතරක් ඉතිරි වේවි!

මේ දේවල් ඔබත් එක්ක බෙදා ගන්න අපගේ ද අඩුපාඩු සොයමින් ඔබගේ වටිනා කාලය හමාර වේවි!

## පැළැත්ම සහ නැළැත්ම

නෙළුම් විල තුල අල මල් ගැන වද පෙන පාර්ශව අතර අපත් සිටියා. සසර කිව්වේ ම ඒ පොරයට තමයි. ඒ මල් වෙනුවෙන්... අල වෙනුවෙන් මිනී මරා ගත්ත වාර අනන්තයි අප්‍රමාණයි! ඒ මල් අල අනුන්ට නොවේවා මට ම වේවා කියලා බලහත්කාරයෙන් සොරකම් කරමින් අයිති කර ගත්ත වාර අනන්තයි අප්‍රමාණයි!

ඒ මල අල වංචනික ව භුක්ති විදීම්... ඒ වංචාවන්ට එරෙහිව අරගල කිරීම් සිදු කල වාර අනන්තයි අප්‍රමාණයි! ඒක තමයි මේ විලේ ස්වභාවය. එයින් යැපෙන තාක් පොර කන්න ම වෙනවා. සාධාරණ අසාධාරණකම් ඒ විල මත යැපෙන තාක් පමණයි!

ඔබ දන්නවද මේ ලෝකයේ සියල්ලෙන් සියල්ල දන්නා සර්වඥයන් වහන්සේ වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා මේ විල ඇතුලේ පොරයේ සාධාරණ අසාධාරණයන් ගැන විග්‍රහ කර දුන්නේ කොහොමද කියලා?

**ඔව්... හේතු ඵල දහම... හේතුවට අනුවයි ඵලය. හේතුව සකස් කරන ක්ෂණයේ දී ම ඵලය සකස් වී අවසන්.**

යමෙක් මේ විල තුල තමන්ටත් අනුන්ටත් හානි වන ආකාරයේ ක්‍රියාවක් කලා නම්, වදනක් කිව්ව නම්, සිතිවිල්ලක් සිතුවා නම් ඒ අනුව ඵලය ඒ මොහොතේ ම සකස් වෙනවා. තවත් විදියකට කියනවා නම්; "**යමෙක් යම් වරදක් යැයි සම්මත දෙයක් කරන මොහොතේ දී ම එයට ගෙවිය යුතු දඩුවමේ ගිවිසුමට අත්සන් තබා අවසන්!**".

උදාහරණයකට ඔබ ඔබට නුදුන් දේ සොරකම් කරන මොහොතේ දී ම ඒ සොරකම වෙනුවෙන් ඔබ වැය කල ශක්තිය මත ඔබ දඬුවම් ලබන කාලය, ඔබ ලබන දඬුවමේ ස්වභාවය, ඔබ ඒ දඬුවම තුලින් කොතරම් විඳවිය යුතු ද, ආදී සියල්ල තීරණය වී අවසන්.

ඔබට මේ සිද්ධිය සාමාන්‍ය බාසාවෙන් කියනවා නම් "ස්වභාව දහමේ නීතිය" කියලා කියන්න පුළුවන්. "ස්ව - භාව - දහම" ඒ කියන්නේ "තමන් සකස් කල බව සහ එය දරා ගෙන සිටින බව" "තමන් හොර බව දරා ගෙන සිටිනවා" නම් ඒ භවයට නියමිත ඵල විපාක වලටත් මුහුණ දෙන්නට ම සිද්ධ වෙනවා.

ඉතින් විලේ බැස ගෙන මල් අල එක්ක ඔට්ටු වෙන බහුතරයට මේ ගැඹුරු දහම් විමසන්නට වෙලාවක් නෑනේ. පොර කන එක තමයි දන්න එකම දේ. එතකොට මගේ උරුමය හොරා ගත්තා කියලා හොරකම දරා ගත්තවුන් එක්ක ඔට්ටු වෙනවා. මිනී මරා ගන්නවා... මිනී මැරූවන් සමඟ ඔට්ටු වෙනවා. දැන් මෙතැනදි මේ බහුතරයට නොදැනෙන යමක් සිද්ධ වෙනවා.

ඒ තමයි ඒ යම් වරදක් කලා වූ පිරිසට ඒ අයගේ වරදට නියමිත වූ ගිවිසුමට අදාල වූ දඬුවමට අමතරව දඬුවමක් තමයි මේ මතුපිටින් දකින අනෙක් පිරිස දෙන්නේ. එතකොට මොකද වෙන්නේ?

## අනුන්ගේ පව් කර ගැසීම

හොඳයි සුවයි සැපයි කියලා ගත්ත අදහසක් නිසා අහක යන නඩුවකට අත දාලා අලුත් හේතු සකස් කර ගන්නවා තමන්ටත් ඒ අනුව දඬුවම් ලැබෙන්නට. **ලෝක සම්මතයෙන් දඬුවම් දෙන මොහොතක් පාසා අලුත් ගිවිසුම් වලට තවත් බොහෝ පිරිසක් අත්සන් තබා ගන්නවා.**

ඉතින් විටෙක පීඩකයා වෙනවා... විටෙක පීඩිතයා වෙනවා... විටෙක සොරා ද... විටෙක සොරකම ට ලක් වෙන්නා ද වෙමින්... විල තුල මහා පොරයක්. විලේ ස්වභාවය හඳුනා ගන්නේ නැති තාක් **මේ අරගලය කවදාවත් සංසිඳෙන්නේ නෑ.** හේතුවට අනුව ඵලය සකස් කරමින්... නැවත ඵලය ම හේතු කර ගනිමින්... ඉවරයක් නැති චක්‍රයකට හසු වෙලා. අලුත් ම පොරයක් වගේ හැමදා ම එකම පොරය.

**මේ දේවල් ගැන අංශු මාත්‍ර තරමින් පවා දැන ගත් සෑම ශාස්තෘවරයෙක් ම අපට මේ දේවල් අඩුවක් නැතිව කියලා දීලා තිබෙනවා. සෑම ආගමක ම විවිධ ආකාරයෙන් මේ දේවල් කියලා තියෙනවා. මේ විලේ ඉන්න පිරිස කෙරෙහි අනුකම්පාවෙන් විවිධ මට්ටමෙන් අනතුරු ඇඟවීම් ලබා දෙනවා. පණිවිඩය ලබා දෙනවා.**

"දෙවියන් වහන්සේ ඔබගේ පව් වලට කර ගසන්නම්... පව් කරන පිරිසට දෙවියන් දඬුවම් කරනවා ඔබ දෙවියන් විශ්වාස කරලා ඔබ ගේ කටයුතු කර ගන්න..." මේ විදියට ඔබ ට සෑම ආගමකින් ම පැවැත්ම තුල අඩුම තරමේ යම් මට්ටමකට හෝ ආරක්ෂිතව කටයුතු කර ගන්නට දේවල් පෙන්වා දෙනවා.




**ඒත් නෑ... ඔබ මල් වලටයි... අල වලටයි කොතරම් වශී වෙලා ද කියනවා නම් එහි "දෙවියන්ගේ දඬුවම් කියමින් දඬුවම් නියම කර ගන්නෙත් අවසානයේ කිලිටි වූ ඔබමයි".**

**ඇත්තට ම කියනවා නම් ඔබ ට මේ ස්වභාව දහමේ නීතිය ගැන කිසිදු විශ්වාසයක් නැති හැඩයි. උතුමන් යැයි සම්මත පිරිසක් ලෝකයේ තමන් නො දන්නා යමක් පවසන බව විශ්වාසයක් නැති හැඩයි. ඉතින් ඔබගේ නැණ පමණින් සාධාරණය අසාධාරණය වෙනුවෙන් සටන් වැදීමට තීරණය කරන විට ඔබට උතුමන්ගේ පණිවිඩය මඟ හැරෙනවා.**

උතුමන්ටත් දොස් තබනවා ඔබ පීඩක පන්තිය නියෝජනය කරනවා කියලා. පීඩිතයන්ට අනුකම්පා කරන්නේ නෑ කියලා. එහෙත් ඒ උතුමන් දන්නවා දෙපාර්ශවය ම අන්ත අසරණ වෙලා ඉන්න නොදරුවන් පිරිසක් කියලා. උන්වහන්සේලාට හැකි පමණින් විවිධ ආකාරයෙන් මේ විල ඇතුලේ ගනුදෙනුව යහපත් ව කර ගන්නට මඟ පෙන්වා දුන්නා. ***අදටත් ඒ දහම් ජීවමානයි.***

ඉතින් මේ විදියට විල තමන්ගේ කර ගෙන මල් අල තමන්ගේ යැයි සිතා ගෙන ඒවාට අයිතිවාසිකම් කියමින් පොර කෑම මේ පැවැත්මයි. **ඒ නිසා මේ නො සංසිඳෙන අරගලය**

**සංසිඳවා ගැනීම පිණිස විලෙන් එතෙර වන අයුරු කාලයකට සැරයක් සර්වඥ වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ කෙනෙක් පෙන්වා දෙනවා. ඉතින් මේ සියලු ම මට්ටමේ ගැඹුරු දහම් අප අතරම අදටත් ජීවමානයි.**

නමුත් හදවත්?

ඔව්... මල යි අල යි බෙදා ගැනීමේ පොරය අතර හදවත් **මොට්ට වෙලා!**

## මග ඵල නැ ගේ ඒකයි!

ඉතින් මල් වලට අල වලට පොර කන පැවැත්ම තෝරා ගත්ත පිරිසට නෙවේ මේ වදන්. ඒ පොරයෙන් ඉවත් වෙන්නට උත්සාහ ගන්න ඔබට යි මේ වදන්.

මේ පැවැත්ම තුල යම් පොරයක් සාධාරණීකරණය කරමින් සාධාරණ අසාධාරණකම් දකින විට... ඒවාට හූ මිටි තබන්නට සිත ඉදිරිපත් වන විට... "**අපි තවම මග ඵල ලබලා නැනේ**" කියන කියමන කියමින් තම තමන්ගේ කෙලෙස් සාධාරණීකරණය කර ගැනීමට පෙර විමසන්න... ඔබ, ඔබ වෙනුවෙන් විමසන්න!

ඔබ මේ විලේ අසරණ වෙලා සිටින නො දරුවන් වෙනුවෙන් විමසන්න!

නොදරුවන්ගේ පොරයට හවුල් වෙලා ඔවුන්ට තාවකාලික ජයක් ලබා දෙන්නට ඔබට හැකි වේවි. නමුත් ඔබ ඔවුන් ව තවත් මේ විල නමැති මඩ ගොහොරුවේ ම අනාථ කර ඇති බව දකින්න!

**"අපි තවම මග ඵල ලබලා නැනේ ඒකයි මේ" කියන්නට කලින් බුදු වෙන්නට පතන මහ බෝසතාණන් වහන්සේටත් "සුවඳ හොරා" කියමින් කල්‍යාණ මිත්‍රත්වයක් ලබා දුන් දේවතාවිය ගැන සිහිපත් කර ගන්න. ඇය ගෞතම බුද්ධ ශාසනයේ මග පල ලබමින් උතුම් අග්‍ර ශ්‍රාවිකාවක් වෙමින් මහ රහත් පදවිය ලැබූ උත්තමාවියක්. නමුත් ඒ දේවතාවියක් ව සිටි අවදියේ මාර්ග පල ලබා ගෙන සිටියේ නැනේ.**

තමන් තපස් දම් රකිනවා නම්... විලෙන් එතෙර වෙන්නට අවශ්‍ය නම්... සුගතියක වත් පිහිටන්න අවශ්‍ය නම්... සැබෑවට ම නිවැරදි දේ ම අගය කරනවා නම්... තමන් ගේ අවංක චුවමනාව නිවැරදිව හඳුනා ගෙන සිටිනවා නම් විය යුත්ත කුමක් දැ යි නුවණින් දැක දැන හඳුනා ගන්නට මාර්ග ඵල ලබන්නට අවශ්‍ය නෑ. සත්පුරුෂ දහම් හඳුනන සත්පුරුෂයන්ටයි ආර්ය දහම් ලැබෙන්නේ.

තමන්ගේ ගැලවුම් කාරයා වීමට අවශ්‍ය පුද්ගලයා ඒ විමුක්තිය පිණිස කැපවීම් සිදු කර ගන්නේ "ශ්‍රමණ ඵල" ලබන්නටත් පෙර සිට ම යි.

ඉතින්, ඒ නිසා

මෙය ද බහුතරයක් වෙනුවෙන් ලියවූ "තවත් එක් බණක්" නොවේ. අප ද අනතුරෙන් ගැලවෙන්නට දුවන අතර ආදරයෙන් ගෞරවයෙන් "ගැලවෙන්නට අවශ්‍යයි යැයි" කියන කල්‍යාණ මිත්‍ර ඔබ වෙනුවෙන් ලබා දෙන අනතුරු ඇඟවීම යි! එයට කන් යොමු කිරීම හෝ නො කිරීම ඔබට භාරයි!

ඔබට අවශ්‍යයි යැයි පවසන දේ ලබා ගැනීම පිණිස, ඔබ විසින් කටයුතු සිදු කර නො ගන්නා බව දැනෙන විට... දකින විට... එය සිහිපත් කර දීම සැබෑ මිත්‍රයා ගේ යුතුකමයි. ඒ තුල ඔබ තව දුරටත් මිත්‍ර කම් පවත්වයි ද නැත් ද යන්නවත් වැදගත් නෑ. මිත්‍රත්වයේ යුතුකම එය යි! ඒ මිත්‍රත්වය හඳුනා ගන්නට දක්ෂ වුවහොත් අප තරම් වාසනාවන්තයින් මේ විල තුල නැති තරම්!

## සාරය නුවණින් දකින්න

**"මලක් නටුවෙන් කඩන්නෙවත් නැතිව දුර තබා සුවඳ බැලූ කල සුවඳ හොරෙක් වෙනවා නම් අන් දේ ගැන කවර කතා ද?"**

ලෝකයෙන් එතෙර වන දහම් අහන්නේ නැති නිසා, ඒ පෙර නො ඇසූ විරූ ඇත්ත ගැන දන්නේ නැති නිසා, තමන්ට අයත් නැති විලත් අයිති කර ගෙන... මලත් අයිති කර ගෙන... අලත් අයිති කර ගෙන... කොළත් අයිති කර ගෙන... නටුත් අයිති කර ගෙන... ගහ මරා ගෙන විලේ ම ගෙම්බෝ මාළුවෝ සර්පයෝ මැසි මදුරුවෝ වෙලා ඉපදෙන්නටත් සිද්ධ වෙනවා. විවිධ ආකාරයෙන් තමන්ට දුන්නේ නැති දේවල් වලින් යැපෙමින් සිදු කල සොරකම් වලට වන්දි ගෙවන්නට සිද්ධ වෙනවා. **ඉතින් ලෝක සම්මතයේ සොරකම්, මැරකම්, දූෂණ, වංචා ආදී අයහපත් යැයි පවසන සියල්ලේ සාධාරණ අසාධාරණ බව ගැන කවර කතා දැයි නුවණක් ඇත්තෝ අවංකව ම ගැඹුරින් විමසා තම තමන්ව නිදහස් කර ගන්නවා!**

**අරමුණක් ලැබෙන විට ඇත්ත නොදන්නාකම නිසා, අවිද්‍යාව නිසා පුණ්‍යාභිසංඛාර, අපුණ්‍යාභිසංඛාර, අනේඤ්ජාභිසංඛාර, කාය සංඛාර, වචී සංඛාර, චිත්ත සංඛාර ආදී ලෙසින් සංකාර සකස් වෙනවා. මේ පැවැත්මේ සැබෑ ම දුක කුමක් දැයි යන්න ගැන ඇති අනවබෝධය මේ සියලු සංස්කාරකයන්ට මුල් වෙනවා. දුක ගැන නොදන්න විට දුකට හේතුව ගැන හෝ දුක නැති කිරීමක් ගැන අවබෝධයෙක් කොහෙත්ම නැනේ නේද? ඒ නිසා පැවැත්ම කියන්නේ ම විටක යමකට හොඳයි... විටක යමකට නරකයි... විටක යමකට උපේක්ෂා සහගතයි ලෙසින් කියන, කරන, සිතන සංඛාර වැඩපිළිවෙල ම තමයි.**

පුණ්‍ය වුවත්... අපුණ්‍ය වුවත්... ඒ දෙකට ම නැති නමුත් ඒ දෙක ඉක්මවා නැති, ඒ තුල ම බැස ගෙන ඇති ආනේඤ්ජාභි වුවත්... කාය වුවත්... වචී වුවත්... චිත්ත වුවත්... සංඛාර නම් සියල්ල සංඛාර ම තමයි.

**"සබ්බේ සංඛාරා අනිච්චා ති... සබ්බේ සංඛාර දුක්ඛා ති..." සංඛාර යැයි යමක් වේ ද සියල්ලෙන් සියල්ල අනිච්චයි... දුක්ඛයි... අහලා තියෙනවා නේද ඒ බුදු වදන? ඉතින් ඒ සංඛාර මත බැස ගෙන විද්‍යාමාන වන එල සියල්ල හෙවත් සියලු ධර්මයන්, "සබ්බේ ධම්මා අනත්තා ති"... අනාථයි... අසාරයි... අනත්තයි!**

**කෙටියෙන් ම කියනවා නම් ඔබ බැස ගෙන ඉන්න විල ම අවුල්!**

මඩ ගොහුරක්... හරයක් නැති අසූචි වලක්... මර උගුලක්... එහි ඇති මල්... අල... කොල... නටු ගැන කවර කතා ද?

දවස පුරාවට පෙනෙන, ඇහෙන, දැනෙන, විඳින වැඩපිළිවෙළ තුල ඔබත් සුවඳ හොරෙක් වෙනවා නේද? අහන්නත් දෙයක් ද නේද? විමසන්න! නුවණින් විමසන්න!

**පෙනෙන, ඇහෙන, දැනෙන, විඳින වැඩපිළිවෙළ තුල ඇලීමෙන්, ගැටීමෙන් ප්‍රතිචාර දක්වන වාරයක් පාසා... ඔබගේ වැඩපිළිවෙළ තුල ඇති සොරකම්, මැරකම්, දූෂණය, මත් බව කොතරම් දැයි විමසන්න!**

## සියලු ලෝ සතට සඹ මෙත

පෙනෙන, ඇහෙන, දැනෙන, විඳින මොහොතේ සතිය මොට්ට නම්... ඒ මොට්ට වූ සතියෙන් අරමුණක් ඇසුරු කරන විට දස අකුසලය තුලට ම බැස ගෙන අවසන් බව තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන්නේ මේ සුවඳ හොරකම් දැක ගන්නටයි.

**මේ විල තුල කව්රු විසින් කාට චෝදනා කරන්න ද...? පීඩකයා කව්ද...? පීඩිතයා කව්ද...? සියලු සත්වයෝ නිදුක් වෙත්වා... නිරෝගි වෙත්වා... සුවපත් වෙත්වා නමුත් හොර මැර වංචා දූෂණ කරන පිරිස හැර...එහෙම ද???**

ඇත්ත දුටු විට මෛත්‍රිය කරුණාව බෙදෙන්නේ නෑ... එය සියලු සත්වයන් කෙරෙහි සමානව යෙදෙන්නට පටන් ගන්නවා. එවැනි සැබෑ මෛත්‍රියක් කරුණාවක්, යම් පාර්ශවයකට ඇලීමක් සේ යමෙක් දකිනවා නම්, ඒ විලේ මඩේ එරුණ මල් වලට අල වලට පොර කන සාමාන්‍ය බහුතරය ගේ මානසිකත්වයයි. කිරි මවුන්ගේ කිලිටි වස්ත්‍රය හා සමාන සිත් ඇති රළු නපුරු මානසිකත්වයයි!

නමුත් සැබෑ මෛත්‍රිය කරුණාව ඒ සෑම සියලු දෙනාට ම සම යි! මේ විල තුල වරදකරුවන් හෝ නිවැරදිකරුවන් නොව, සිටින්නේ තම තමන් කියපු / කියන, කරපු / කරන, හිතපු / හිතන දේවල් වලට හොඳ හෝ නරක විපාක විඳින, ලෝකයට බැස ගෙන අනතුරට පත් **නොදරුවන් පිරිසක් පමණ ම යි!**

ඉතින් පුංචි දරුවෙක් ගින්දර එක්ක සෙල්ලම් කරන විට ගින්දරේ අනතුර දන්න වැඩිහිටියන් ඒ දරුවන්ට ඒ අනතුර ඇසුරු කරන්නට රුකුල් දෙන්නේ නෑ වගේ... මේ නොදරුවන්ගේ ලාමක වැඩ වලට යම් ගැඹුරක් දුටු වන් සහාය වෙන්නේ නෑ. දරුවෝ නම් ඉතින් අඬනවා... බනිනවා... ගහන්නත් හදනවා... චෝදනා කරනවා... නමුත් ඔවුන් නො දන්නා, නො දැක්ක අනතුර එයිට වඩා දරුණුයි නේ, ඒ නිසා දන්නා, දක්නා පිරිස ඒ දේවල් අගය කරන්නේ නෑ. වචනයකින් වත් උපකාර කරන්නේ නෑ. සිතිවිල්ලකින් වත් අනුබල දෙන්නේ නෑ!

ඉතින් අවංකව ම විලෙන් එතෙර වන්නට කැමති ඔබ, වරද වරද සේ දැක.... අනතුර නිවැරදිව හඳුනා ගෙන... හික්මීම පිණිස අප්‍රමාදී වෙත්වා!

**පෙනුමෙන් ඉන්නේ ගිහි භූමියේ ද පැවිදි භූමියේ ද කියන දේ වුවත් අදාළ නෑ! පැවිදි භූමියේ ඉන්න අපට ගිහියන්ගේ බණ එපා කියලා හෝ... ගිහි වතේ ඉන්න අපට ඔච්චර ගැඹුරින් දහම් එපා කියලා හෝ...**

**මොන මොනවා හෝ හේතු ඉදිරිපත් කරමින් මේ ශාසනයත් මඟ හරවා ගන්නට කටයුතු නොකර ගැනීම ප්‍රඥාවන්ත ඔබට භාරයි! ගිහි වේවා පැවිදි වේවා අපි හැමෝම ඉන්නේ මේ මඩ ගොහුරේ...! එකිනෙකාට කල්‍යාණ මිතුරන් වෙමින් එයින් ගොඩ එමට උපකාර කර ගැනීම අපට ම භාරයි! අප විශ්වාස කරන්නේ එලෙසයි!**

මෙසේ පවසන අපටත් කලින් ඔබට නිවනින් නිවෙන්නට ප්‍රඥාව ම ලැබෙත්වා! හරියට මහ බෝසතාණන් වහන්සේ ට "සුවඳ හොරා" යැයි පවසා සතියේ පිහිටන්නට උපකාර කල දේවතාවියට... තමන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වෙලා මේ සසරේ පෙර නො ඇසූ විරූ සොරකමේ ගැඹුර පෙන්වා දුන්නා සේ...

"නුදුන් දෙය ගැන්ම හැර, නුදුන් දෙය ගැන්මෙන් වැළකුණ... දුන් දෙය ම ගන්නා සුලු වූයේ, දුන් දෙය කැමති වන සුලු වූයේ... සොර නොවූ පිරිසුදු වූ සිතින් වාසය කරන..." ඒ උතුම් මහ රහත් ඵලයේ සුව ලබන්නට මඟ පෙන්වා දුන්නා සේ...

ඔබටත් ඉක්මනින් නිවී අපටත් මඟ පෙන්වා දෙන්නට හැකි වේවා යන්න මෙත් සිතින් සෙත් පැතුමයි!

**හික්මීම... සංවරය... තමන්ට යි... සිත, කය, වචනය සංවර ව හික්මීම පූර්ණ වන්නේ යම් මොහොතක ද ඒ මොහොතේ පටන් ගෙන ඔබ ඔබගේ ම ගැලවුම් කරුවා වී හමාරයි! සිහියෙන් නුවණින් විරියෙන් පෙර නො ඇසූ විරූ දහම් විමසන්නාට අමා මහ නිවන් දොර විවර වීම නියතයකි!**

ඔබ සැමට තෙරුවන් සරණයි!

මේ දහම් විග්‍රහයට පෙනෙන නොපෙනෙන වශයෙන් සහ සම්බන්ධ වෙලා චිත්ත ප්‍රසාදයෙන් යුතුව සවන් දීලා මේ දහම් විග්‍රහයේ ගැඹුර විමසන්නට සිතක් හෝ පහල කර ගත්ත පෙනෙන නොපෙනන සියලු ලෝක සියලු සත්වයින්ට සසර සුවපත් භාවයම වෙත්වා!

මේ විලෙන් මේ ලෝකයෙන් මේ මඩ ගොහුරෙන් එතෙර වෙන්නට අප්‍රමාදී බවම සකස් වෙත්වා! උතුම් තෙරුවනේ අනන්ත අප්‍රමාණ ආශිර්වාදය අඩුවක් නැතුවම ලැබෙත්වා!



# සුවඳ සොරුන් මෙන

*ආදරණීය පිවිසෙන්නන් උදෙසා...*

"සියලු ලෝක සියලු සත්වයන්ට කල්ප ගණනාවකට වතාවක් අති දුලභ අවස්ථාවක් ලැබෙනවා. එනම් අති දුලභ වූත් අති උතුම් වූත් සම්මා සම්බුද්ධ ශාසනයක් පවතින කාලයක උපතක් ලබා ගැනීමට හැකි වීමයි. ඒ උපතත්... යමක් දැනුම් තේරුම් කර ගන්නට හැකි මානසිකත්වයක් සහිත උපතක් නම්, ඔබ සැබැවින් ම ලබා ඇත්තේ අති දුලභ වාසනාවක් මැ යි. එහෙත් ඒ වාසනාව අවාසනාවක් වන්නට යන වෙන්නෙ ත් ඉතාමත් සුළු මොහොතක් ම යි.

අන්න ඒ නිසා ලැබූ භාග්‍ය අභාග්‍යයක් වීමට නො දී, මේ දිවියෙන් නිසි වූ මහත් ඵල මහානිසංසයන් නෙළා ගැනීම පිණිසත්... ලබා ඇති අති දුලභ වූ සම්මා සම්බුද්ධ ශාසනයෙහි සැබෑ වටිනාකම හඳුනා ගෙන කටයුතු කිරීම පිණිසත්... ප්‍රතිරූපක දහම් පරදා තථාගත ශ්‍රී සද්ධර්මය විවර කර බැබළීම පිණිසත්... කල්‍යාණ වැට නො කඩා සම්බුද්ධ අවවාදයන් ට අනුව ම ශාසනය නිසි සේ සුරැකීම පිණිසත්... ගිනි ගෙන දැවෙන බොහෝ හදවත් නිවනින් නිවා සුවපත් කර වීම පිණිසත්... "නිර්වාණ ධර්ම" සදහම් සත්කාරයේ මේ පුංචි වෑයමත් හේතු උපකාර වේවා!!! තෙරුවන් සරණ ලැබ සියලු ලෝ සත සසර සුවපත් භාවයට ම පත් වේවා!!!"

රජිතා විදුරන්සි | කැළණිය, ශ්‍රී ලංකා

NIRVANA DHAMMA
නිර්වාණ ධර්ම
www.nirvanadhamma.com